ResearchGate

See discussions, stats, and author profiles for this publication at: https://www.researchgate.net/publication/346411665

# Settlement Pattern of Pre and Proto History period in Hill Country Region -Sri Lanka

**Article** · January 2019

CITATIONS
0

1 author:

Thusitha Mendis

89 PUBLICATIONS 1 CITATION

SEE PROFILE

**Some of the authors of this publication are also working on these related projects:**

Project Settlement Archaeology of Middle Deduru Oya and Mee Oya Basin Research Project View project

Project Settlement Archaeology of Middle Yan Oya Basin Research Project View project

All content following this page was uploaded by Thusitha Mendis on 27 November 2020.

The user has requested enhancement of the downloaded file.

# දුම්බර අභිමානී
## ශාස්ත්‍රීය සංග්‍රහය

දුම්බර වෙසක් පෙරහැර
දසවැනි සංවත්සර සාරසංහිතාව



සංස්කාරක
හාල්යාලේ පඤ්ඤදානන්ද හිමි

Scanned with CamScanner

# දුම්බර අභිමානී ශාස්ත්‍රීය සංග්‍රහය

## දුම්බර වෙසක් පෙරහැර දසවැනි සංවත්සර සාරසංහිතාව

© හාල්යාලේ පඤ්ඤානන්ද හිමි

ප්‍රථම මුද්‍රණය 2019

ISBN 978-955-43404-1-1

පරිගණක පිටු සැකසුම : විජේවර්ධන ක්‍රියේෂන්ස්

පිටකවර නිර්මාණය : ශාන්ත විජේවර්ධන

මුද්‍රණය : සයිබර්ගේට් සර්විසස්
සෝරත මාවත,
ගංගොඩවිල, නුගේගොඩ.

ප්‍රකාශනය : දුම්බර වෙසක් පෙරහැර කමිටුව
තෙල්දෙණිය.

Scanned with CamScanner

# මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ප්‍රාග්, පූර්ව හා මුල් ඓතිහාසික අවධියේ මානව ජනාවාසකරණය

ඩී. තුසිත මැන්දිස්

## හැඳින්වීම

ශ්‍රී ලංකා ඉතිහාසයේ විවිධ කාල පරාසවල මානව ජනාවාසකරණය සම්බන්ධයෙන් ඉතා වැදගත් වූ භූමි ප්‍රදේශයක් වශයෙන් මධ්‍ය කඳුකරය හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාවේ ඉතිහාසය රචනා කරන ලද ගිහි පැවිදි විද්වත්හු ශ්‍රී ලංකා ද්වීපයේ ආදිත ම මානව ජනාවාස වීම් සම්බන්ධ ව ඉතිහාසයේ වැදගත් භූමි ප්‍රදේශ ලෙස සළකනු ලැබ ඇත්තේ උතුරු මැද පලාත මුල් කරගත් අනුරාධපුරය හා මාගම මුල් කරගත් තිස්සමහාරාමය ආශ්‍රිත භූමි ප්‍රදේශ වේ. එම නිසා ශ්‍රී ලංකාවේ ආදිත ම ඉතිහාසයට අයත් මධ්‍ය කඳුකරය තුළ වූ ආදිත ම ජන පැළපදියම් වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉතිහාස ලියා ඇති ඉපැරණි මූලාශ්‍රය ග්‍රන්ථ තුළින් තොරතුරු කිසිවක් හඳුනාගත නොහැකි වී ඇත. එම නිසා මෙම භූමි ප්‍රදේශයේ ආදිත ම ඉතිහාසයට අයත් තොරතුරු ආන්තිකකරණයකට ලක්වී තිබේ. සුවිශේෂ භූ රූපනයක් සහිත මහනුවර හා තදාශ්‍රිත භූමි ප්‍රදේශ තුළ මෙතෙක් සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණවලට අනුව මෙම ප්‍රදේශවල මුල් ජන පදිංචි වීම් පිළිබඳ පුරාවිද්‍යා සාධක උතුරු මැද පලාත හා අග්නිදිග ශ්‍රී ලංකාවට වඩා බොහෝ පැරණි වන බව හඳුනාගෙන තිබේ. එම නිසා ඉතිහාසය රචනා කරන

Scanned with CamScanner

ලද බොහෝ ගිහි පැවිදි විද්වත්හු සාකච්ඡාවට බඳුන් කර ඇති ක්‍රි.ව 1357 සිට ක්‍රි.ව 1815 දක්වා වූ නූතන ඉතිහාසයට ගොනුගත වී ඇති මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ඉතිහාසය ප්‍රාග්, පූර්ව හා මුල් ඓතිහාසික යුග තුළ දී අතිශය වැදගත් වූ භූමියක් වූ අන්දම මෙම රචනය තුළින් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ.

## විමර්ශනය

### මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික අවධියේ මානව ජනාවාසකරණය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය සාහිත්‍ය මූලාශ්‍රය තොරතුරු අනුව මධ්‍ය කඳුකරය හඳුන්වා ඇත්තේ මලය, මලය රට්ඨය, මහා මලය රට්ඨය හා මලය මණ්ඩලය යන නම්වලිනි ( මව. vii: 68; චූව. 70 : 3-5).සාහිත්‍යය මූලාශ්‍රයවල සඳහන් වන ඉහත නාමකරණයන් තුළින් කන්ද, උස්භූමිය යන අරුත දෙන මධ්‍ය කඳුකරය සහස්සවත්ථුවේ ගිරිමණ්ඩලය යනුවෙන් හඳුන්වා ඇත. ගිරිමණ්ඩලය යන වචන විමර්ශනය කිරීමෙන් කඳු පද්ධතිය නැතහොත් කඳුකරය ඉන් ගම්‍ය වන අතර මලය යන්න වචනය මලෙයි යන වචනයෙන් බිඳී ආ බව තහවුරු කරගත හැකි වේ (සහස්ස : 83 - 94 ). මූලාශ්‍රය බොහෝමයක ම සුවිශේෂී භෞමික පාරසරික කලාපයක් ලෙස හඳුන්වා ඇති මධ්‍ය කඳුකරය එහි පවතින දුෂ්කරතාවයන් මත ම එම ප්‍රදේශයේ ජීවත් වූ ආදිත ම ජනයා හඳුන්වා ඇත්තේ පුලින්ද, ව්‍යාද, මිලක්ඛ, මනුස්ස, උපචරක ආදී වශයෙන් බව සහස්වත්ථුවේ වැඩිදුරටත් දක්වා ඇත (එම). මධ්‍ය කඳුකරය ගැන විස්තර කරන චූලවංසය මෙසේ දක්වා ඇත'' එය විශාල කඳුවලින් බහුලය, තරණය කිරීමට අපහසුය, රුදුරු සතුන් ජීවත්වන ප්‍රදේශයකි. එහි වසන මිනිසුන් පවා බොහෝ දුරට හුදෙකලා ජීවිත ගත කරති. ගමන් කළ හැක්කේ අඩි පාරවල පමණි, මිණීකන කිඹුලන් හා ජලජ ස්ථාන එහි පිහිටා ඇත'' (චූව. 70 : 3- 5 ). සාහිත්‍ය මූලාශ්‍රය තොරතුරුවලට අනුව මධ්‍ය කඳුකරයේ පැවති දුෂ්කරතාවයන් හා එහි විසූ ජනතාව වෙන ම ජන කොටසක් ලෙස ආදිත ම ඉතිහාසය තුළ ජීවත් වූ බව පෙන්වා දීමට මූලාශ්‍රයවලින් උත්සාහ ගෙන ඇති බව මේ පිළිබඳ ව විමර්ශනය කිරීමෙන් පැහැදිළි වේ.

Scanned with CamScanner

ඓතිහාසික සම්භාව්‍ය සාහිත්‍ය ලේඛන තුළින් දක්වා තිබෙන විස්තරවලට අනුව ආන්තිකකරණයට ලක්ව තිබූ මධ්‍ය කඳුකරය ආශ්‍රිත ව සැඟව තිබූ ඉතිහාසය සොයා අධ්‍යයනයන් සිදු වූයේ ඉතාම මෑත භාගයේ දී ය. ඒ අනුව හුදෙකලා විවේකී ප්‍රදේශ ලෙස මූලාශ්‍රයවල හඳුන්වා තිබූ මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ පුරා මානව ජනාවාසකරණය ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා අවධියේ (Mesolithic Period ) සිට ආරම්භ ව තිබූ බව මේ වන විට තහවුරු කර ගෙන තිබේ. විශේෂයෙන් ම ආදී ජන පැළපදියම් වීම් පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී මහනුවර නගරය කේන්ද්‍රගත කරමින් පමණක් ඒ පිළිබඳ ව විමර්ශන කිරීම සිදු කළ නොහැකි වේ. විශේෂයෙන් ම මේ වන විට පුරාවිද්‍යා පර්යේෂණ වඩා පුළුල් ආකාරයට මධ්‍ය කඳුකරයේ සාර්ව භූමිය පුරාම සිදු වී නොමැති නිසා ආදිත ම ජන පදිංචි වීම් පිළිබඳ ව අධ්‍යයනය කළ හැක්කේ මෙතෙක් පර්යේෂණ සිදු කර ඇති ස්ථාන ආශ්‍රයෙන් අනාවරණය කර ගත් තොරතුරු පදනම් කරගනිමිනි. ඒ අනුව මධ්‍ය කඳුකරය ආශ්‍රිත ප්‍රාග් ඓතිහාසික අවධියේ දී ජනතාවගේ පදිංචිවීමේ මෝස්තරය දෙස බැලීමේ දී මධ්‍ය ශිලා මිනිසුන් අදින් අවුරුදු 37000 කට පෙර සිට කුරුවිට බටදොඹ ලෙන ආශ්‍රිත ව ද වසර 30000 කට පෙර කිතුල්ගල බෙලි ලෙන ආශ්‍රිත ව ද වාසය කළ බවට තොරතුරු මේ වන විට අනාවරණය කර ගෙන තිබේ (Deraniyagala : 1992 ; Perera : 2014). ඊට අමතර ව කෑගල්ලට නුදුරු අළු ලෙන ආශ්‍රිත ව වසර 10350කට පෙර මධ්‍ය ගල් යුගයේ මිනිසුන් වාසය කර ඇති බවට ද තොරතුරු තහවුරු කර ගෙන ඇත. මේ සඳහා පුරාවිද්‍යා සාධක ලෙස මානව සැකිලි හා මානවයින් සිය දඩයම් කටයුතුවලට භාවිත කරන ලද ශිලා මෙවලම් පෙන්වාදිය හැකි ය (එම ). මේ ආකාරයට මහනුවර ප්‍රදේශයට පර්යන්ත ප්‍රදේශයේ ඉතා ඈත අතීතයේ ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට ම මානව ජනාවාසකරණයට ලක් වී ඇති ආකාරය පුරාවිද්‍යා කැණීම් තුළින් පැහැදිළි කර ගෙන තිබේ.

මහනුවරට ඉතා ආසන්නයෙන් ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා මානවයා වාසය කළ බවට තොරතුරු මුලින් ම යොයා ගනු

Scanned with CamScanner

ලබන්නේ ගම්පොළ හා පේරාදෙණිය ප්‍රදේශ තුළිනි. යටත් විජිත පාලන සමයේ දී මෙම ප්‍රදේශ ආශ්‍රිත ව ගවේශණය කරන ලද ඊ. ඊ ග්‍රීන් (E. E. Green ) විසින් 1885 වසරේ දී ගමපොළ හා පේරාදෙණිය ප්‍රදේශයෙන් ශිලා මෙවලම් හමු වූ බව වාර්තා කර ඇත (Sarasing 1926 : 81 Deraniyagala in 1992 : 3 ). තිරුවානා ( Quartz ) හා කහද (Chartz ) යන ඛනිජ පාෂාණ භාවිතයෙන් නිර්මාණය කර ඇති මෙම ශිලා මෙවලම් මධ්‍ය ගල් යුගයේ දී එම ප්‍රදේශයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයින් භාවිත කරන්නට ඇති බව සිරාන් දැරණියගල උපකල්පනය කරනු ලැබේ ( Deraniyagala 1992 : 3 ). මෙයට අමතර ව 2017 වර්ෂයේ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය විසින් තෙල්දෙණිය ප්‍රදේශයේ එනම් වර්තමානයේ වික්ටෝරියා ජලාශයට යට වී ඇති භූමියේ පැරණි පොලිසිය ස්ථානගත ව තිබූ ස්ථානය ආශ්‍රිත ව සිදු කරන ලද ක්ෂේත්‍ර විමර්ශනයක දී එම ස්ථානය ආශ්‍රිත ව විශාල ප්‍රමාණයක් තිරුවානා පතුරු පැවති බව හඳුනාගන්නා ලදි. එම තිරුවානා පතුරු එකතු කර සිදු කරන ලද විමර්ශනවල දී පැහැදිලි වූයේ ඒවා බොහොමයක් ශිලා මෙවලම් වන බවය. විශේෂයෙන් සකස් කිරීම්වලට ලක්කර ඇති තල (Blade) සීරුම් මෙවලම් (Scraper ) මෙන් ම තැළුම් උපකරණ ( Chopping tool ) රාශියක් එම ස්ථානයේ පවතින බව තහවුරු කර ගැනීමට හැකි වූ අතර එම ශිලා මෙවලම් වාර්තාවන ස්ථානය ජලාශයේ ජලය පිරෙන අවස්ථාවල දී ජලයෙන් යට වී පවතී. විශේෂයෙන් ම මෙවැනි ස්ථාන ප්‍රාග් ඓතිහාසික අවධියේ ශිලාමෙවලම් නිෂ්පාදන මධ්‍යස්ථාන වශයෙන් ( Stone tool production site ) ක්‍රියාත්මක ව පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

මෙම තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ මහනුවරට ඉතා නුදුරු ප්‍රදේශ තුළ ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍ය ශිලා මිනිසුන් පදිංචි වී සිටින්නට ඇති බව ය. විශේෂයෙන් ම තෙල්දෙණිය ජලාශයට ආසන්නයේ ඇති බඹරගල ආශ්‍රිත ව හා ගෝණවත්ත ආශ්‍රිත ව විශාල වශයෙන් ස්වභාවික ශිලා ආවරණ (Rock Shelter) පවතින අතර එවැනි ස්ථාන ආදිත ම කාලයේ දී මිනිසුන්ට

Scanned with CamScanner

පහසුවෙන් අව්වෙන් හා වැස්සෙන් බේරී සිටීමට හැකි ස්ථාන වේ. මුල් ඓතිහාසික අවධිය (Early history) වන විට මෙවැනි ස්ථාන කටාර කොටා භික්ෂු වාසස්ථාන ලෙස සකස් කිරීමෙන් අනතුරු ව එතෙක් එම ස්ථානවල පැවති ප්‍රාග් ඓතිහාසික තැන්පතු එවැනි ස්ථානවලින් ඇද දැමීම නිසා බොහෝ විට ගුහා අභ්‍යන්තර තුළින් ප්‍රාග් ඓතිහාසික සාධක හඳුනාගත නොහැකි වී තිබේ.

විශේෂයෙන්ම මෙවැනි භූමි ප්‍රදේශ ආශ්‍රයෙන් ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා මානවයින්ට සිය වාසස්ථාන පිහිටුවා ගැනීමේ දී ප්‍රදේශයේ ඇති ඛනිජ සම්පත්වල පිහිටීම ද බලපාන්නට ඇත. ඉහළ කඳුකරයේ සිට ගලන මහවැලි ගඟ හා තලාතු ඔය වැනි ජල මූලාශ්‍ර මෙම ප්‍රදේශයට ආසන්න ව පිහිටා ඇති නිසා එම ගංගා ආශ්‍රිත ව කහඳ ( Chartz ) හා තිරුවානා (Quartz) යන ඛනිජ පාෂාණවල බහුල බවක් දැක ගත හැකි ය. කහඳ හා තිරුවානා පාෂාණ ප්‍රාග් ඓතිහාසික යුගයේ දී අතිශයින් වැදගත් ඛනිජයක් වූයේ ශිලා මෙවලම් නිර්මාණය සඳහා ඒවා භාවිත කරන ලද බැවිනි. එම නිසා තෙල්දෙණිය, ගම්පොළ මෙන් ම පේරාදෙණිය අවට කලාපය තුළ පිහිටන ස්වභාවික පරිසර තත්තවය හා දඩයමට අවශ්‍ය කරන පහසුකම් මෙම ප්‍රදේශය ඇසුරින් පැවති නිසා ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා මානවයා මෙම ප්‍රදේශය තුළ ජීවත් වන්නට ඇති බව පෙන්වාදිය හැකි ය.

## මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ පූර්ව ඓතිහාසික අවධියේ මානව ජනාවාසකරණය

මහනුවර හා තදාශ්‍රිත කලාපයේ පුරාණ මාවන ජනාවාසකරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී මීළගට වැදගත් වන්නේ පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධියයි. මහනුවර සානුවේ සිට මාතලේ සානුව දක්වා දිවෙන භෞමික ක්ෂේත්‍රය හා මහනුවර සානුවේ සිට රඹුක්කන දක්වා දිවෙන භෞමික ක්ෂේත්‍රය පූර්ව ඓතිහාසික අවධියේ දී මානව ජනාවාසකරණය සම්බන්ධයෙන් වැදගත් වේ. මෙහි දී මාවතැල්ල අරණායක මාර්ගයේ වාකිරිගල මාර්ගයට ආසන්න ව ගල්අතර ප්‍රදේශයේ

Scanned with CamScanner

පූර්ව ඉතිහාසයට අයත් සුසාන පිහිටා ඇත. චාර්ල්ස් ගොඩකුඹුර හා සුදර්ශන් සෙනවිරත්න පෙන්වා දී ඇති ආකාරයට ශිලා මංජුසා සුසාන (Cist Burial) හා සමහරවිට බරණී සුසාන මෙම ස්ථානයේ පවතින බව හඳුනාගෙන තිබේ ( ASAdR 1966 - 67 : 64 ; Seneviratne , 1984 : 237 - 305 Senaviratne 2007 : 162:). මීට අමතර ව රඹුක්කනට නුදුරු පදවිගම්පොළ ශිලා මඤ්චක හෙවත් දොල්මන් ( Delmenoid) වර්ගයේ පූර්ව ඓතිහාසික යුගයේ සුසානයක් පවතින අතර එමඟින් පැහැදිලි වන්නේ ද මහනුවරට පර්යන්ත ප්‍රදේශයේ බටහිර පස කලාපයේ පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස මුල් බැස ගැනීමක් සිදු වී ඇති බව ය ( Senaviratne 2007 : 162 ; රඹුක්වැල්ල 1998 : 17 - 22 ).

මහනුවර සානුවේ සිට දඹුල්ල දක්වා උතුරු භෞමික ක්ෂේත්‍රය තුළට පූර්ව ඓතිහාසික යුගයේ ජන ඇතුළුවීම තුළින් පෙන්නුම් කරන්නේ ඔවුන් සම්පත් අත්පත් කර ගැනීම හා ඒවා බෙදා හැරීම සඳහා වන්නා වූ ක්‍රියාවලියකට අවතීරණ වී ඇති බව ය. ක්‍රි.පූ 700 - 400 අතර කාලය තුළ දී මධ්‍ය කඳුකරයේ උතුරු කඳු බැවුම තුළ විශේෂයෙන් ම ඉබ්බන්කටුව, ගලේවෙල, ආනකටාව, වට්ටක්කා වාඩිය ආදී ප්‍රදේශ ඇසුරෙන් පූර්ව ඓතිහාසික යුගයේ ජන පදිංචිවීම් හඳුනාගත හැකි වේ. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට මෙම ප්‍රදේශවල පූර්ව ඓතිහාසික යුගයේ වාසස්ථාන පිහිටුවා ගනු ලබන්නේ ඉහළ කලා ඔය පද්ධතියේ ඇති ඛනිජ සම්පත් හා කුළුබඩු අත්පත් කර ගැනීම සඳහා බව ය. විශේෂයෙන් පහළ කඳුකර කලාපයේ හා වියලි කලාපයේ ජීවත් වූ පූර්ව ඓතිහාසික ජනපදිකයින්ගේ අවශ්‍යතා සඳහා ඛනිජ හා කුළුබඩු ලබා ගැනීම සඳහා පූර්ව ඓතිහාසික අවධියේ දී උතුරු කඳු බැවුම තුළට ජනතාව ප්‍රවිෂ්ට වී ඇත ( Senavirathne 1996 : 285). කඳුකර කලාපය තුළ පිහිටන්නා වූ ඛනිජ සම්පත් වන තිරුවානා, මිනිරන්, තඹ මෙන් ම විවිධ කුළු බඩු වර්ග සඳහා මෙම යුගයේ විශේෂ ඉල්ලුමක් පැවති අතර එම ඉල්ලුම කරන කොට ගෙන මෙම ප්‍රදේශ වෙත පූර්ව ඓතිහාසික මිනිසුන් ආකර්ෂණය වී තිබේ. ආර්ථික සිද්ධාන්ත අනුව ද ඉල්ලුමේ ඇතිවන වෙනස්කම්

Scanned with CamScanner

මත විවිධ භාණ්ඩ සඳහා පවතින කාර්යබද්ධ වටිනාකම සාපේක්ෂ ලෙස වෙනස් වේ. පූර්ව ඓතිහාසික අවධියේ දී ද මෙම තත්ත්වය ඛනිජ පාෂාණ ඇසුරින් හඳුනාගත හැකි අතර ඉබ්බන්කටුවේ සිදු කරන ලද කැණීම් තුළින් එම ප්‍රදේශයට ආවේණික නොවන කහද, තිරුවානා ආදී ඛනිජ පාෂණ කුටීර සුසාන අභ්‍යන්තරයෙන් ලැබීම තුළින් එම යුගයේ දී එම ඛනිජ සඳහා විශේෂ ඉල්ලුමක් පැවති බව පැහැදිළි වේ. මහනුවර හා මාතලේ සානුවේ සිට රබහ ( Garnet), පළිගු Crystal), චන්ද්‍රකාන්ත පාෂාණ (Moonstone), කහද (Chertz), තෝරමල්ලි ( Tourmaline), ඇමතෙස්ත (Amethyst) ආදී ඛනිජ වර්ග හා කුළු බඩු වර්ග හුලංගමුව, ගල්ලෙන් වත්ත, අළුවිහාර, තල්ගහගොඩ, අස්ගිරිය, යටවත්ත, ගණේගෙදර, සුළුපනාපහු විහාර, තිළගම, ඔස්සේ දඹුල්ල දක්වා පුරාණ මාර්ගය ඔස්සේ පහළ කඳුකර කලාපයේ පැවති පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස වෙත පැමිණෙණනට ඇති බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇත ( *ibid* : 189 ). මෙම තත්තවය වැඩිදුරටත් ඉතා හොඳින් හඳුනාගත හැක්කේ අනුරාධපුර ඇතළුපුරයේ සිදු කර ඇති පුරාවිද්‍යා කැණීම් තුළිනි. එම කැණීම්වල දී ක්‍රි.පූ 500 ට පසු ජනාවාස ස්තරවල තිබී කඳුකරයේ සම්භවය ලබන ඉහත සඳහන් කරන ඛනිජ පාෂාණ වර්ගවල බහුල භාවිතය හඳුනාගෙන තිබේ ( Deraniyagala : 1972 ).[31] ඒ අනුව මහනුවර හා ඊට ආසන්න ප්‍රදේශවල ජීවත් වූ ජනතාව කඳුකර කලාපයේ සිට අනුරාධපුරය දක්වා ම මෙවැනි ඛනිජ වර්ග බෙදා හැර ඇති බව මෙම පුරාවිද්‍යා කැණීම් තුළින් ද පැහැදිළි වී තිබේ. ඒ අනුව පූර්ව ඓතිහාසික අවධියේ දී මහනුවර භෞමික ක්ෂේත්‍රයට පර්යන්ත ප්‍රදේශ තුළ පූර්ව ඓතිහාසික අවධියේ තාක්ෂණික සංස්කෘතික පිරිස් ජනාවාස පිහිටුවා ගෙන සිට ඇත්තේ ඛනිජ සම්පත් හා කුළුබඩු වර්ග අත්පත් කර ගැනීමට බව මේ අනුව පෙන්වාදිය හැකි ය.

## මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ මුල් ඓතිහාසික අවධියේ මානව ජනාවාසකරණය

මහනුවර හා තදාශ්‍රිත කලාපයේ පුරාණ මානව ජනාවාසකරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී මීළඟට

Scanned with CamScanner

වැදගත් වන්නේ මුල් ඓතිහාසික ( Early historic ) සංස්කෘතික අවධියයි. ක්‍රි.පූ. 300 ක්‍රි.ව. 100 අතර කාලයට අයත් වන මුල් ඓතිහාසික අවධියේ දී මහනුවර අවට කලාපය තුළ විශාල ලෙස මානව ජනාවාසකරණයක් සිදු වී ඇති බව පෙනේ. ඒ බව වේගිරි දේවාල, දුල්වල, මොරගොඩ, ගෝණවත්ත, බඹරගල, නෙළුව කන්ද, අළුවිහාර, හුලංගමුව, රුසිගම, දෙමඩ ඔය, ඇඹුල්අබේ, ආදි ස්ථාන ඇසුරින් පැහැදිළි වේ. මෙම සංස්කෘතික පරිවර්තන අවධිය පිළිබඳ ව අදහස් දක්වා ඇති විද්වතුන් පෙන්වා දී ඇත්තේ මුල් ඓතිහාසික යුගය යනු පූර්ව ඓතිහාසික අවධියේ වඩා දියුණු ප්‍රභිච්ඡින්න පැතිකඩක් බව ය. එනම් පූර්ව ඓතිහාසික අවධිය හා මුල් ඓත්හාසික අවධිය නියෝජනය වන්නේ එකම ජනකණ්ඩායමකින් බව ය. විශේෂයෙන් ම ඉහත සඳහන් ස්ථාන ඇසුරින් ජනාවාස, නිෂ්පාදන මධ්‍යස්ථාන, හුවමාරු හා බෙදාහැරීම් මධ්‍යස්ථාන පැවති බව පර්යේෂණවල දී පැහැදිළි වී තිබෙන අතර තාක්ෂණයේ හා අක්ෂර භාවිතයේ පැවැති නිපුණතාව නිසා මෙම යුගයේ තොරතුරු ඉතා හොඳින් හඳුනාගත හැකි ව තිබේ. විශේෂයෙන් ම මහනුවර නගරයෙන් නැගෙනහිර ප්‍රදේශය ආශ්‍රයෙන් ගෝණවත්ත හා බඹරගල ප්‍රදේශය ඇසුරින් ප්‍රාදේශීය පාලනයක් ක්‍රියාත්මක වූ බවට තොරතුරු තිබේ. ගෝණවත්ත ප්‍රදේශයේ පිහිටුවා ඇති මුල් බ්‍රාහ්මී අභි ලේඛනයක මහා චූඩික රජ පරපුර පිළිබඳ ව සඳහන් වේ (*Ic.* vol. i : No.831) එම ශිලා ලේඛනය අනුව මහා චූඩික පරපුරින් පැවත එන පාලකයකු වශයෙන් අභය රජ හඳුන්වා ඇත ( *ibid* : i). ලෙස්ලි ගුණවර්ධන පෙන්වාදෙන ආකාරයට ගෝණවත්ත ලිපියේ සඳහන් පොවුනිකරඩ හා තෙල්දෙණියට නුදුරු බඹරගල ඇති මුල් බ්‍රාහ්මී අභිලේඛනයක සඳහන් වන පොවතික-රඩනග එකම පරපුරකට සම්බන්ධ වූ ප්‍රාදේශීය පාලකයන් වන බව පෙන්වා දී ඇත ( Gunawardana 1982 : 12-13). ඒ අනුව මුල් ඓතිහාසික අවධිය වන විට මහනුවර අවට කලාපයේ ප්‍රාදේශීය පාලනයක් බිහිව තිබූ බව මෙම ශිලා ලේඛනවලින් පැහැදිළි වේ.

මෙම ප්‍රාදේශීය පාලන ව්‍යුහ සැකසීම සඳහා ස්වභාවික සම්පත් අත්පත් කර ගැනීමේ කාර්යය වැදගත් වූ බව පෙන්වාදිය

Scanned with CamScanner

හැකි ය. විශේෂයෙන් පහත් වියළි තැනිතලා භූමි කෘෂි කාර්මික කටයුතු සඳහා වඩාත් යෝග්‍ය භූමි වූ නිසා පූර්ව ඓතිහාසික අවධියේ දී මෙන් ම මුල් ඓතිහාසික අවධියේ දී ද එම භූමි යෝග්‍ය වී ඇත්තේ කෘෂි කටයුතු සඳහා ය. නමුත් එම කාල පරාසය තුළ ම මහනුවර හා තදාශ්‍රිත කඳුකර කලාපය වැදගත් වී ඇත්තේ කෘෂි කටයුතු සඳහා නොව ඛනිජ සම්පත් සඳහා බව මුල් බ්‍රාහ්මී අභිලේඛනවලින් පැහැදිළි වේ. ගෝණවත්ත ශිලා ලේඛනයේ සඳහන් වන මවුඩික යන නාමය තුළින් චූඩ යන්නෙන් මැණික යන්න ගම්‍ය වන බැවින් මහාචූඩික යන්නෙන් මහා මැණික යන්න පැහැදිළි වන බැවින් මහා චූඩික පරපුර මැණික් කර්මාන්තය ඇතුළු වටිනා ඛනිජ සම්පත් හැසිර වූ කණ්ඩායමක් විය හැකි බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇත ( Senavirathne 1996 : 193 ). මෙම කණ්ඩායම මහනුවර සානුවේ සිට මාතලේ සානුව ඔස්සේ දඹුල්ල දක්වා වන උතුරු කඳු බෑවුම් කලාපය දක්වා ම සිය පාලන කටයුතු හසුරුවා ඇති බව දෙමඩ ඔය, ඇඹුල් අඹේ ආදී ප්‍රදේශ තුළින් හමුවන මවුඩික හා පොචුනික ශිලා ලිපි තුළින් පැහැදිළි වේ (*Ic.* vol. i. : No 830, 831, 832, 833 ). මේ පිළිබඳ ව වැඩිදුරටත් විස්තර කරන සුදර්ශන් සෙනෙවිරත්න මහා චූඩික පරපුර මහනුවර හා තදාශ්‍රිත කලාපයේ මැණික් ගල් හා මිනිරන් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරන්නට ඇති බවත් ඔවුන් ඒවා අනුරාධපුර ප්‍රධාන වෙළඳ පොළ දක්වා පරිවහනය කරන්නට ඇති බවත් පෙන්වා දී තිබේ ( Senavirathne 1996 : 193 ). ඒ අනුව පොචුනික රාජ පරපුර ඛනිජ සම්පත් අත්පත් කර ගැනීම මෙන් ම බෙදාහැරීම් කටයුතු ද මහනුවර හා නාලන්ද ප්‍රදේශයේ සිට සිදු කර ඇති බව පැහැදිළි වේ. මේ බව වැඩි දුරටත් තහවුරු වන්නේ මතලේට නුදුරු උඩුපිහිල්ල ප්‍රදේශයේ දී සොයාගන්නා ලද ගෝලාකාර හැඩයෙන් යුත් පිළිස්සූ මැටි පුවරු මඟිනි. එම මැටි පුවරුවල දක්නට ලැබෙන හිතිමං සළකුණු හා එහි කොටා ඇති බ්‍රාහ්මී අක්ෂරවලින් හඳුනාගත හැකි තිශ යන නාමය තුළින් ඔවුන්ගේ පාලන බලය තහවුරු වේ. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇති ආකාරයට මෙහි සඳහන් තිශ යන්න ගෝණවත්ත

සෙල්ලිපියේ සඳහන් ගමණි තිශ යන්න හා සැසඳීමෙන් එමඟින් එක් පරපුරක් නියෝජනය වන බැවින් එමඟින් පොවුනික රාජ පරම්පරාවේ වංශාවලී අනුක්‍රමිකතාව හඳුනාගත හැකි බව පෙන්වා දී ඇත (එම).

ඉහත සඳහන් කරන ලද පාලන කටයුතුවලට අමතරව මේ කාලයේ දී මහනුවර හා තදාශ්‍රිත කලාපයේ විවිධ ශිල්ප නිෂ්පාදන කටයුතු සිදු කරන ලද ජන පිරිස් ද ස්ථානගත ව සිටි බවට ද තොරතුරු හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම ගම්පොළට නුදුරු වේගිරි දේවාලය ආශ්‍රිත ව හමුවන මුල් බ්‍රාහ්මී අභිලේඛනයක කුබකර (කුම්බකාරයන්) හා දටික (දළ කැටයම් කරුවන් ) පිළිබඳ ව සඳහන් වේ ( *Ic*. vol. i : No 807 ). ඒ අනුව එම ප්‍රදේශ ආශ්‍රිත ව විවිධ ශිල්ප කටයුතුවලට සම්බන්ධ ජන පිරිස් සිය ජනපද පිහිටුවා ගෙන සිටි බව වැඩිදුරටත් පැහැදිළි වේ. එසේ ම බඹරගලින් හමුවන තවත් එක් ශිලා ලිපියක කොලගම පිළිබඳ ව හා චිත නගරය පිළිබඳ ව සඳහන් වේ( *Ic*. vol. i : No 814 ). දෙන්නේ දමිල භාෂාවෙන් කොල් යන්න මඟින් ලෝහ යන්න ගම්‍ය වන බැවින් කොළගම යනු ලෝකුරුවන් නිවැසි ගමක් වන බවය (සෙනෙවිරත්න 1996 : 21 ). බඹරගල හා ඒ අවට වර්තමානයේ සිදු කර ඇති පුරාවිද්‍යා අධ්‍යයනවලින් ද එම ප්‍රදේශය ආශ්‍රිත ව තඹ හා රිදී පවතින බව හඳුනාගෙන ඇත. මෙසේ විවිධ ශිල්පීන් විසින් මහනුවර අවට ප්‍රදේශයේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ග්‍රාම, සුළු වෙළඳ පොළ, නගර ඔස්සේ ශ්‍රේණි හා මණ්ඩල ලබාදුන් දායකත්වය ඔස්සේ දඹුල්ල ප්‍රදේශය දක්වා පැමිණ ඇති බව මුල් බ්‍රාහ්මී ශිලා ලිපිවල සඳහන් කරුණු ඔස්සේ අවබෝධ කර ගත හැකි ය. විශේෂයෙන් භාණ්ඩ හුවමාරු කරන ලද එවැනි ග්‍රාම ස්ථාන වශයෙන් දඹුල්ල ප්‍රදේශයෙන් හමුවන මතුකගම ( *Ic*. vol. i : No 837). රකිතගම (*ibid* :No 840). හා සුළු වෙළඳ පොළ වශයෙන් පැවති ස්ථාන වන උපරිකඩ ( *ibid* :No 841 ). භාණ්ඩ පරිවහනයේ දී වැදගත් වූ ස්ථාන බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (සෙනෙවිරත්න 1996 : 21- 22). මෙසේ ග්‍රාම නගර ඔස්සේ භාණ්ඩ බෙදාහැරීම සඳහා සංවිධානය වූ ව්‍යුහයක් ලෙස පුග හා ශ්‍රේණි

Scanned with CamScanner

ක්‍රියාත්මක වී ඇත ( ඩයස් 1991 : 3- 5 ). පූග හා ශ්‍රේණි පිළිබඳ ව විග්‍රහ කරන මහින්ද කරුණානායක පූගය බලපවත්වන ප්‍රදේශයේ එම ප්‍රදේශ ආශ්‍රයෙන් ක්‍රියාත්මක වූ විවිධ කර්මාන්ත හා වෙළඳාම් පිළිබඳ ව ඔවුන් සොයා බැලූ බව පෙන්වා දී ඇත (කරුණානායක 1967 : 63 ). ඒ අනුව පූගය අනිවාර්යයෙන් ම භාණ්ඩ එකතු කර ප්‍රධාන වෙළඳ පොළ දක්වා ඒවා බෙදාහරින ලද සංවිධානයක් බව පෙන්වාදිය හැකි ය. ශිලා ලිපිවල සඳහන් ග්‍රාම හා කඩ ජාලය පිළිබඳ ව විග්‍රහ කරන සුදර්ශන් සෙනෙවිරත්න පාරිසරික භූ රූපන කලාප කිහිපයක් අතර වූ සම්පත් පරිවහන ක්‍රියාවලිය සඳහා ඒවා ක්‍රියාත්මක වූ අන්දම පෙන්වා දී තිබේ ( සෙනෙවිරත්න 1996 : 20 ). විශේෂයෙන් ම කඩ යන්නෙන් ද්වාරය, සුළු වෙළඳ පොළ අර්ථවත් වන බව පෙන්වාදෙන සෙනෙවිරත්න පාරිසරික ක්ෂේත්‍ර දෙකක් අතර භාණ්ඩ හුවමාරු කිරීමට මුල් ඓතිහාසික යුගයේ දී එම ස්ථාන වැදගත් වූ අන්දම පෙන්වා දී ඇත ( සෙනෙවිරත්න 1996 : 21- 22). මෙම කරුණු පිළිබඳ ව විමර්ශනාත්මක ව විමසීමේ දි පැහැදිළි වන්නේ මුල් ඓතිහාසික අවධියේ දි මහනුවර හා තදාශ්‍රිත කලාපය තුළ ඛනිජ සම්පත් අත්පත් කර ගැනීම මෙන් ම ඒ ආශ්‍රිත වානිජ ජාලයක් ඉතා විධිමත් ව ක්‍රියාත්මක වීමට අවශ්‍ය කරන ව්‍යුහය ඉතා විධිමත් ලෙස සැකසී තිබූ බව පැහැදිළි වන බව ය.

## සමාලෝචනය

මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ ප්‍රාග්, පූර්ව හා මුල් ඓතිහාසික අවධියේ මානව ජනාවාසකරණය පිළිබඳ ව සිදු කරන ලද විමර්ශනයේ දී පැහැදිලි වූයේ මූලාශ්‍රයවල හුදෙකලා ප්‍රදේශයක් ලෙස විස්තර කර ඇති මධ්‍ය කඳුකරය ඉතා ඈත අතීතයේ සිට ම මානව ජනාවාසකරණයට ලක් වෙමින් තාක්ෂණික සංස්කෘතික පරිවර්තන ඔස්සේ මේ දක්වා ම වැදගත් භූමියක් වූ බව ය. විශේෂයෙන් ම වියළි තැනිතලා භූමි ප්‍රදේශ තුළ කෘෂිකාර්මික කටයුතු සඳහා පූර්ණ ඉඩකඩක් සැකසීමේ දී මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශය ඉන් පරිබාහිර ක්‍රියාවලට අවතීර්ණ වෙමින් ආර්ථික කටයුතු

Scanned with CamScanner

හා ශිල්ප නිෂ්පාදන කටයුතු මෙන් ම සම්පත් පරිහරණයට අදාළ විශාල දායකත්වයක් පූර්ව හා මුල් ඓතිහාසික අවධිය වන විට ලබා දී ඇති බව පුරාවිද්‍යා හා බ්‍රාහ්මී අභිලේඛනගත තොරතුරු ඔස්සේ හඳුනාගත හැකි ව තිබේ. ඒ සමඟ ම සම්පත් හැසිරවීමේ ක්‍රියාවලිය ඔස්සේ එම ප්‍රදේශ ආශ්‍රිත ව ඒ හා බද්ධ වූ ප්‍රාදේශීය පාලන ක්‍රමයක් ක්‍රමානුකූලව නිර්මාණය වී ජනාවාස ධුරාවලී පද්ධතියක් සැකසී සමාජ ආර්ථික දේශපාලන ව්‍යුහයක් මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ මුල් ඓතිහාසික අවධිය වන විට නිර්මාණය වී තිබූ බව මෙම කරුණු ඔස්සේ හඳුනාගත හැකි බව පෙන්වාදිය හැකි ය. එම තත්ත්වය ඉංග්‍රීසීන් උඩරට රාජධානිය යටත් වන අවධිය දක්වා ම පැවතුන අතර උඩරට රාජධානියේ ක්‍රියාත්මක වූ රාජකාරි කුල ධුරාවලිය සැකසීම සඳහා අති පුරාණයේ සිට ම මහනුවර හා එහි තදාශ්‍රිත කලාපයේ සිදු වූ මානව ජනාවාසකරණය බලපාන්නට ඇතැයි මේ අනුව පෙන්වාදිය හැකි ය.

## තෝරාගත් මූලාශ්‍ර


01. ගයිගර් සමරු කලාපය, සංස්. ලබුහේන්ගොඩ චන්ද්‍රරතන හිමි, ධාරා පාලි සඟරා සම්පාදක මණ්ඩලය, කොළඹ, 67-76 පිටු.

02. චූලවංසය (සිංහල) සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි; දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, තෘතීය මුද්‍රණය, ආණ්ඩුවේප්‍රවෘත්ති දෙපාර්තුමේන්තුව, බු.ව. 2496

03. මහාවංසය (සිංහල), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි; දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, සීමාසහිත දීපානි ප්‍රකාශන පෞද්ගලික සමාගම, නුගේගොඩ, 1996.

04. සහස්සවත්ථුපකරණය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 1959

05. රඹුක්වැල්ල, චූලනී, පදවිගම්පොල ප්‍රදේශයේ ප්‍රාථමික යකඩ යුගයේ පුරාවිද්‍යාව, පරාස්ථාන ස්ථානගත වීමේ වැදගත්කම, *Ancient Ceylon* Colombo 1998.

06. ඩයස්, එම්., අභිලේඛනමය සටහන්, පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව, කොළඹ. 1991


Scanned with CamScanner

07. සෙනෙවිරත්න, සුදර්ශන්, ඓතිහාසික මහනුවර, ශ්‍රී සුමංගල විද්‍යාලයීය බෞද්ධ සංගමය, මහනුවර, 1996. 184-199 පිටු

08 Deraniyagala,S.U. Archaeological Survey to Investigate South east Asian Prehistoric Presence in Ceylon Occasion paper No.1 (ed).W.G. Solhaeim & S.U. Deraniyagala ***Ancient Ceylon*** August 1972, Archaeological Survey Department, Colombo. 1972.

09 ***The Prehistory of Sri Lanka*** ;An Ecological Perspective, Archaeological Survey Department, Colombo. 1992.

10 Gunawardena, R. A. L. H. 1982., prelude to the State: An Early Phase in the Evaluation of political Institutions in Ancient Sri Lanka1 - 39, ***The Sri Lanka Journal of the Humanities. Vol II. VIII Nos 1&2*** , University of peradeniya.

Paranavitane,S. 1970., ***Inscription of Ceylon***, Vol. I , Colombo, Department of Archaeology Ceylon , Colombo

11 Seneviratne , S. 1984., The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka, ***Ancient Ceylon*** No . 5 : 237-305.

12 Peripheral Regions and Marginal Communities : Towards an Alternative Explanation of Early Iron age Maternal and social Organization in Sri Lanka 265-312***Tradition Dissent and Ideology : Essay in Honor of Romila Thapar***, ed. K. Campakalakshmi and S.Gopal, Oxford University Press, Delhi. 1996.,

Scanned with CamScanner

View publication stats